## ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය

## ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍යාංශය

# කොළඹ තදාසන්න දුම්රිය ව්‍යාපෘති කළමනාකරණ ඒකකය

# පුරප්පාඩු - ව්‍යාපෘති කාර්ය මණ්ඩලය

දුම්රිය කාර්යක්ෂමතාවය ඉහළ නැංවීමේ ව්‍යාපෘතියේ (REIP) පවතින පහත සඳහන් පුරප්පාඩු වෙනුවෙන් ව්‍යාපෘති කාර්ය මණ්ඩලය බඳවා ගැනීම සඳහා කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 01/2019 ප්‍රකාරව කොළඹ තදාසන්න දුම්රිය ව්‍යාපෘති කළමනාකරණ ඒකකය විසින් අයදුම්පත් කැඳවනු ලැබේ.

මෙම ව්‍යාපෘතිය ආසියානු සංවර්ධන බැංකු ණය යටතේ ප්‍රවාහන, මහාමාර්ග හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය සහ ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව එක්ව ක්‍රියාත්මක කරනු ලබයි.

ඒ අනුව ඉහත ව්‍යාපෘතිය තුළ පවතින පහත සඳහන් පුරප්පාඩු තනතුරු පිරවීම සඳහා ඉංග්‍රීසි භාෂාව පිළිබඳ නිපුණත්වය, රජයේ නීති රෙගුලාසි පිළිබඳ පරිචය සහ විදේශ ආධාර ලබන ව්‍යාපෘති යටතේ පුද්ගලයන් නැවත පදිංචි කිරීමේ ක්‍රියාවලිය පිළිබඳ පළපුරුද්ද යන පූර්ව අවශ්‍යතා සපුරාලන සුදුසුකම් සහිත ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් මෙයින් අයදුම්පත් කැඳවනු ලැබේ.

| අංක | තනතුර | වැටුප් මට්ටම | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|
| 01. | සහකාර ව්‍යාපෘති අධ්‍යක්ෂ (මුදල්) | PS-4 | 01 |
| 02. | සහකාර ව්‍යාපෘති අධ්‍යක්ෂ (ඉංජිනේරු) | PS-4 | 01 |
| 03. | ජ්‍යෙෂ්ඨ ප්‍රසම්පාදන නිලධාරී | PS-5 | 01 |
| 04. | ජ්‍යෙෂ්ඨ තාක්ෂණ නිලධාරී | PS-5 | 01 |
| 05. | ව්‍යාපෘති ලේකම් | PS-6 | 01 |

ඉහත සඳහන් තනතුරුවලට අදාළ සුදුසුකම් / පළපුරුද්ද පිළිබඳ අවශ්‍යතා පහත පරිදි වේ.

### 01. සහකාර ව්‍යාපෘති අධ්‍යක්ෂ (මුදල්) - තනතුරු සංඛ්‍යාව 01

ආසියානු සංවර්ධන බැංකු මාර්ගෝපදේශ අනුව නියෝජ්‍ය ව්‍යාපෘති අධ්‍යක්ෂ (මූල්‍ය) යටතේ කාර්යය / කර්තව්‍ය ඉටුකරමින් ව්‍යාපෘති අධ්‍යක්ෂට පූර්ණ සහය දැක්විය යුතු අතර, ව්‍යාපෘතියට අදාළ අයවැය ලේඛන, ඇස්තමේන්තු සැකසීම, කාර්තුමය වාර්තා සකස් කිරීම, ගෙවීම් කටයුතු ඇතුළු සියලුම මූල්‍ය ක්‍රියාකාරකම් ඉටුකිරීම හා වගකීම් දැරීම කළ යුතුය.

**අවශ්‍ය සුදුසුකම් :**

(පහත අනු අංක 01 හෝ 02 අතරින් එක් සුදුසුකමක් )

1. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන අදාළ ක්ෂේත්‍රයේ උපාධියක් ලබා තිබීම.

**හෝ**

අදාළ ක්ෂේත්‍රයේ උපාධියකට සමාන සුදුසුකමක් ලෙස විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන සුදුසුකමක් ලබා තිබීම.

**හෝ**

අදාළ ක්ෂේත්‍රයට අයත් වෘත්තියවේදී ආයතනයක පූර්ණ සාමාජිකයෙකු වීම හෝ එවැනි ආයතනයකින් සමාන වෘත්තීය සුදුසුකමක් ලබා තිබීම.

**සහ**

සමාන තත්ත්වයේ විදේශ අරමුදල් සපයනු ලබන ව්‍යාපෘතියක මූල්‍ය ක්ෂේත්‍රයට අදාළව අවම වශයෙන් වසර 09ක පළපුරුද්ද ලබා තිබීම.

2. රජයේ දීප ව්‍යාප්ත ගණකාධිකාරී සේවයේ III / II වැනි ශ්‍රේණියේ නිලධාරියකු වීම.

**සමග**

III/II ශ්‍රේණියේ තනතුරක අවම වශයෙන් වසර 9ක සේවා පළපුරුද්දක් ලබා තිබීම.

### 02. සහකාර ව්‍යාපෘති අධ්‍යක්ෂ ( ඉංජිනේරු) - තනතුරු සංඛ්‍යාව 01

ව්‍යාපෘති අධ්‍යක්ෂ යටතේ කාර්යය/කර්තව්‍ය ඉටුකරමින් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා ව්‍යාපෘති අධ්‍යක්ෂට පූර්ණ සහය දැක්විය යුතු අතර, ක්‍රියාත්මක කිරීමේ උපදේශන ආයතනය හා ශ්‍රී ලංකා දුම්රිය සේවයේ ව්‍යාපෘති කාර්ය මණ්ඩලය සමග සම්බන්ධීකරණය කිරීම, ව්‍යාපෘතිය විසින් අරමුදල් සපයා ඉදිකරනු ලබන වැඩබිම් අධීක්ෂණය හා කොන්ත්‍රාත් කළමනාකරණය කිරීම.

**අවශ්‍ය සුදුසුකම්:**

(පහත අනු අංක 01 හෝ 02 අතරින් එක් සුදුසුකමක් )

1. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව (UGC) විසින් පිළිගනු ලබන, ඉංජිනේරු විෂය ධාරාවේ සිවිල් ඉංජිනේරු ක්ෂේත්‍රයේ ප්‍රථම උපාධියක් සහිත වීම.

**හෝ**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව (UGC) විසින් පිළිගනු ලබන ඉංජිනේරු විෂයධාරාවේ සිවිල් ඉංජිනේරු ක්ෂේත්‍රයේ ප්‍රථම උපාධියකට සමාන උපාධියක් සහිත වීම.

**හෝ**

සිවිල් ඉංජිනේරු ක්ෂේත්‍රය සම්බන්ධයෙන් පිළිගත් වෘත්තියවේදී ආයතනයක් වෙතින් ලබාගත් ඉහත සඳහන් සුදුසුකම්වලට සමාන සුදුසුකම් සහිත වීම හෝ එවැනි ආයතනයක පූර්ණ සාමාජිකත්වය දැරීම.

**සමග**

සමාන තත්ත්වයේ විදේශ අරමුදල් සපයනු ලබන ව්‍යාපෘතියක ඉංජිනේරු ක්ෂේත්‍රය තුළ අවම වශයෙන් වසර 9ක පළපුරුද්ද ලබා තිබීම .

2. රජයේ දීප ව්‍යාප්ත ඉංජිනේරු සේවයේ III/ II ශ්‍රේණියේ නිලධාරියකු වීම.

**සහ**

III/II ශ්‍රේණියේ තනතුරක අවම වශයෙන් වසර 9ක සේවා පළපුරුද්දක් ලබා තිබීම.

### 03. ජ්‍යෙෂ්ඨ ප්‍රසම්පාදන නිලධාරී - තනතුරු සංඛ්‍යාව 01

නියෝජ්‍ය ව්‍යාපෘති අධ්‍යක්ෂ (ප්‍රසම්පාදන) යටතේ කාර්ය/ තත්ත්වයන් ඉටුකරමින් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා ජ්‍යෙෂ්ඨ ප්‍රසම්පාදන නිලධාරී විසින් ප්‍රසම්පාදන සැලසුම් සකස් කිරීම, ප්‍රසම්පාදන කමිටුව සහ තාක්ෂණික ඇගයීම් කමිටු සකස් කිරීම, ආසියානු බැංකු මාර්ගෝපදේශනය අනුව ප්‍රසම්පාදන ලේඛන සකස් කිරීම හා ගිවිසුම් සකස් කිරීම කළ යුතුය.

**අවශ්‍ය සුදුසුකම්:**

(පහත අනු අංක 01 හෝ 02 අතරින් එක් සුදුසුකමක් )

1. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන අදාළ ක්ෂේත්‍රයේ ප්‍රථම උපාධියක් ලබා තිබීම.

තාක්ෂණික ක්ෂේත්‍රයට අදාළ තනතුරක් සඳහා තෘතියික සහ වෘත්තිය අධ්‍යාපන කොමිෂන් සභාව පිළිගනු ලබන තාක්ෂණික/ වෘත්තිය පුහුණු මධ්‍යස්ථානයකින් නිකුත් කරනු ලබන ජාතික වෘත්තිය කුසලතා (NVQ) 07 මට්ටම නොඅඩු ප්‍රවීණතාවය පිළිබඳව සහතිකයක් ලබා තිබීම

**සහ**

සමාන තත්ත්වයේ විදේශ අරමුදල් සපයනු ලබන ව්‍යාපෘතියක ප්‍රසම්පාදන ක්‍රියාවලිය සම්බන්ධයෙන් අවම වශයෙන් වසර 04ක පළපුරුද්ද ලබා තිබීම.

**හෝ**

2. තාක්ෂණික ක්ෂේත්‍රයට අදාළ තනතුරක් සඳහා තෘතියික සහ වෘත්තිය අධ්‍යාපන කොමිෂන් සභාව පිළිගනු ලබන තාක්ෂණික/ වෘත්තිය පුහුණු මධ්‍යස්ථානයකින් නිකුත් කරනු ලබන ජාතික වෘත්තිය කුසලතා (NVQ) 06 මට්ටම නොඅඩු ප්‍රවීණතාවය පිළිබඳව සහතිකයක් ලබා තිබීම

**සහ**

සමාන තත්ත්වයේ විදේශ අරමුදල් සපයනු ලබන ව්‍යාපෘතියක ප්‍රසම්පාදන ක්‍රියාවලිය සම්බන්ධයෙන් අවම වශයෙන් වසර 09ක පළපුරුද්ද

**හෝ**

3. තාක්ෂණික ක්ෂේත්‍රයට අදාළ තනතුරක් සඳහා තෘතියික සහ වෘත්තිය අධ්‍යාපන කොමිෂන් සභාව පිළිගනු ලබන තාක්ෂණික/ වෘත්තිය පුහුණු මධ්‍යස්ථානයකින් නිකුත් කරනු ලබන ජාතික වෘත්තිය කුසලතා (NVQ) 05 මට්ටම නොඅඩු ප්‍රවීණතාවය පිළිබඳව සහතිකයක් ලබා තිබීම

**සහ**

සමාන තත්වයේ විදේශ අරමුදල් සපයනු ලබන ව්‍යාපෘතියක ප්‍රසම්පාදන කටයුතු සම්බන්ධයෙන් අවම වශයෙන් වසර 14ක පළපුරුද්ද ලබා තිබීම.

### 04. ජ්‍යෙෂ්ඨ තාක්ෂණික නිලධාරී - තනතුරු සංඛ්‍යාව 01

සහකාර ව්‍යාපෘති අධ්‍යක්ෂ (ඉංජිනේරු) යටතේ කාර්ය/ කර්තව්‍ය ඉටුකරමින් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා ව්‍යාපෘති අධ්‍යක්ෂකට පූර්ණ සහය දැක්විය යුතු අතර ව්‍යාපෘතිය විසින් අරමුදල් සපයා ඉදිකරනු ලබන වැඩබිම් පරීක්ෂා කිරීම, වාර්තා ඉදිරිපත් කිරීම, ප්‍රමාණ සමීක්ෂණ කටයුතු හා බිල්පත් පරීක්ෂාව හා කොන්ත්‍රාත් කළමනාකරණයට සහය ලබා දීම.

**අවශ්‍ය සුදුසුකම් :**

(පහත අනු අංක 01 හෝ 02 හෝ 03 අතරින් එක් සුදුසුකමක් )

1. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව (UGC) විසින් පිළිගනු ලබන අදාළ ක්ෂේත්‍රයේ ප්‍රථම උපාධියක් ලබා තිබීම.

**හෝ**

තාක්ෂණික කේෂ්ත්‍රයට අදාළ තනතුරක් සඳහා තෘතියික සහ වෘත්තිය අධ්‍යාපන කොමිෂන් සභාව පිළිගනු ලබන, තාක්ෂණික/වෘත්තිය පුහුණු මධ්‍යස්ථානයකින් නිකුත් කරනු ලබන ජාතික වෘත්තිය කුසලතා (NVQ) 7 මට්ටමට නොඅඩු ප්‍රවීණතාවය පිළිබඳ සහතිකයක් ලබා තිබීම.

**සහ**

අදාළ කේෂ්ත්‍රය තුළ (විශේෂයෙන්ම සමාන තත්ත්වයේ විදේශ අරමුදල් සපයනු ලබන ව්‍යාපෘතියක් තුළ) වසර 04ක පළපුරුද්ද, ප්‍රමාණ සමීක්ෂණය පිළිබඳව වෘත්තිය සුදුසුකමක් ලබා තිබීම සහ දුම්රිය කේෂ්ත්‍රයට අදාළ පළපුරුද්දක් සතුවීම අමතර සුදුසුකමක් වනු ඇත.

**හෝ**

2. තාක්ෂණික කේෂ්ත්‍රයට අදාළ තනතුරක් සඳහා තෘතියික සහ වෘත්තිය අධ්‍යාපන කොමිෂන් සභාව පිළිගනු ලබන, තාක්ෂණික/වෘත්තිය පුහුණු මධ්‍යස්ථානයකින් නිකුත් කරනු ලබන ජාතික වෘත්තිය කුසලතා (NVQ) 6 මට්ටමට නොඅඩු ප්‍රවීණතාවය පිළිබඳ සහතිකයක් ලබා තිබීම.

**සහ**

අදාළ කේෂ්ත්‍රය තුළ (විශේෂයෙන්ම සමාන තත්ත්වයේ විදේශ අරමුදල් සපයනු ලබන ව්‍යාපෘතියක් තුළ) වසර 09ක පළපුරුද්ද, ප්‍රමාණ සමීක්ෂණය පිළිබඳව වෘත්තිය සුදුසුකමක් ලබා තිබීම සහ දුම්රිය කේෂ්ත්‍රයට අදාළ පළපුරුද්දක් සතුවීම අමතර සුදුසුකමක් වනු ඇත.

**හෝ**

3. තාක්ෂණික කේෂ්ත්‍රයට අදාළ තනතුරක් සඳහා තෘතියික සහ වෘත්තිය අධ්‍යාපන කොමිෂන් සභාව පිළිගනු ලබන, තාක්ෂණික/වෘත්තිය පුහුණු මධ්‍යස්ථානයකින් නිකුත් කරනු ලබන ජාතික වෘත්තිය කුසලතා (NVQ) 5 මට්ටමට නොඅඩු ප්‍රවීණතාව පිළිබඳ සහතිකයක් ලබා තිබීම.

**සහ**

සමාන තත්ත්වයේ විදේශ අරමුදල් සපයනු ලබන ව්‍යාපෘතියක තාක්ෂණික කටයුතු සම්බන්ධයෙන් අවම වශයෙන් වසර 14 ක පළපුරුද්ද, ප්‍රමාණ සමීක්ෂණය පිළිබඳව වෘත්තිය සුදුසුකමක් ලබා තිබීම සහ දුම්රිය කේෂ්ත්‍රයට අදාළ පළපුරුද්දක් සතුවීම අමතර සුදුසුකමක් වනු ඇත.

### 05. ව්‍යාපෘති ලේකම් - තනතුරු සංඛ්‍යාව 01

ව්‍යාපෘති අධ්‍යක්ෂ යටතේ කාර්යය / කර්තව්‍ය ඉටුකරමින් ව්‍යාපෘති අධ්‍යක්ෂ කාර්යාලයේ සියලුම සම්බන්ධීකරණ කටයුතු සඳහා ව්‍යාපෘති අධ්‍යක්ෂට පූර්ණ සහය දැක්විය යුතු අතර, දුම්රිය දෙපාර්තමේන්තුව, ප්‍රවාහන අමාත්‍යාංශය ඇතුළුව සියලු පාර්ශවකාර ආයතන සමග විධිමත් සම්බන්ධීකරණයක් පවත්වාගත යුතුය.

**අවශ්‍ය සුදුසුකම් :**

(පහත අනු අංක 01 හෝ 02 අතරින් එක් සුදුසුකමක්)

1. ඉංග්‍රීසි සහ සිංහල/දෙමළ විෂයන් සඳහා සම්මාන සාමාර්ථ සහිතව සම්මාන 03ක් සමග විෂයන් 6ක් අ.පො.ස.(සා.පෙ) සමත්වීම.

**සහ**

රජයේ පිළිගත් ආයතනයකින් ලේකම් පාඨමාලාවක් හදරා තිබීම හෝ වරලත් ලේකම් තනතුර දක්වා විභාග / සුදුසුකම් හදරමින් සිටීම.

**සමග**

සමාන තත්ත්වයේ විදේශ අරමුදල් සපයන ව්‍යාපෘතියක වසර 6 ක සේවා පළපුරුද්ද ලබා තිබීම.

2. සමාන තත්වයේ විදේශ අරමුදල් සපයන ව්‍යාපෘතියක වසර 05ක පළපුරුද්දක් සහිත වරලත් ලේකම්වරයෙකු වීම.

**වැටුප් පරාසය :**

PS - 04 මට්ටම රු.155,000 - 170,000
PS - 05 මට්ටම රු.105,000 - 113,000
PS - 06 මට්ටම රු.67,000 - 73,000

**පොදු කොන්දේසි :**

1. වයස් සීමාව. සෑම අයදුම්කරුවෙකුම වයස අවුරුදු 64ට අඩු අයවලුන් විය යුතුය. (වයස අවුරුදු 64ට වැඩි අයවලුන් සලකා නොබැලේ).
2. සේවක අර්ථ සාධක අරමුදල සඳහා දායකත්වය (සේවකයාගෙන් 8%ක් සහ සේවා යෝජකයාගෙන් 12%).
3. සේවයෙහි යෙදවීම පිළිබඳ කොන්දේසි : ආරම්භයේ දී මෙම පත්කිරීම කොන්ත්‍රාත් පදනමින් වසරක් (01) සඳහා වන අතර, සතුටුදායක කාර්ය සාධනය හා ව්‍යාපෘති කාල සීමාව මත පදනම්ව සේවා කාලය දීර්ඝ කර ගැනීමේ හැකියාව පවතී.

**අයදුම්පත් :**

ඉහත සඳහන් සුදුසුකම්වලින් හෙබි අයදුම්කරුවන් ස්වකීය අධ්‍යාපනික, වෘත්තිය සුදුසුකම් සහ අදාළ කේෂ්ත්‍රයන්ගේ පළපුරුද්ද පිළිබඳ විස්තර සහ ඥාතීන් නොවන නිර්දේශකයින් දෙදෙනෙකුගේ ද විස්තර දැක්වෙන අයදුම්පත් 27.01.2026 දිනට හෝ ඊට පෙර ලැබෙන සේ ව්‍යාපෘති අධ්‍යක්ෂ, දුම්රිය කාර්යක්ෂමතාවය ඉහළ නැංවීමේ ව්‍යාපෘතිය, නො. 217, කොටා පාර, කොළඹ 08 යන ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම් කරන තනතුර කවරයේ වම්පස ඉහළ කෙළවරේ පැහැදිලිව සටහන් කර එවිය යුතුය.

රාජ්‍ය සේවයේ/ අර්ධ රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් ස්වකීය අයදුම්පත් අදාළ දෙපාර්තමේන්තු ප්‍රධානීන් මාර්ගයෙන් එවිය යුතු වේ.

**ව්‍යාපෘති අධ්‍යක්ෂ,**
**කොළඹ තදාසන්න දුම්රිය ව්‍යාපෘතිය,**
**නො. 217, කොටා පාර, කොළඹ 08.**
**2026.01.13**